# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

2023 බෞද්ධ, හින්දු, කතෝලික හා ඉස්ලාම් දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාග සඳහා 2023.11.10 දින සිට 2023.11.20 දක්වා මාර්ගගතව අයදුම්පත් කැඳවනු ලැබේ.

මාර්ගගතව අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය පරිශීලක නාම හා මුරපද ලියාපදිංචි දහම් පාසල් ප්‍රධානීන් වෙත මේ වන විට තැපැල් කර යවා ඇත. පරිශීලක නාම හා මුරපද නොලැබුණු ලියාපදිංචි දහම් පාසල් වේ නම් ලියාපදිංචි අංකය, ලිපිනය හා දුරකථන අංකය සමඟ පහත සඳහන් ෆැක්ස් අංකය වෙත 2023.11.15 දිනට පෙර ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

අදාළ ආගමික කටයුතු දෙපාර්තමේන්තු මගින් 2023.11.03 දින හෝ 2023.11.10 දින ගැසට් පත්‍රයේ අදාළ විභාග නිවේදන පළ කරනු ඇත. දහම් පාසල් ප්‍රධානීන්ට සිය දහම් පාසල අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත ආගමික කටයුතු සමායෝජකගෙන් වැඩිදුර තොරතුරු හා අයදුම්පත් යොමු කිරීම සඳහා අවශ්‍ය සහාය ලබාගත හැකිය.

දුරකථන අංක - **011- 2785230 / 011- 3661244 / 011- 3661246**

ෆැක්ස් - **011-2784232**

5/5/2/AD/2023
ආයතනික විභාග සංවිධාන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.
2023 නොවැම්බර් 03

එච්.ජේ.එම්.සී. අමිත් ජයසුන්දර,
විභාග කොමසාරිස් ජනරාල්